සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

අවසාන වාර පරීක්ෂණය 2015

විද්‍යාව

06 ශ්‍රේණිය **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සියලුම ජීවීන් තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
(1) ප්‍රභාසංස්ලේෂණය (2) ප්‍රජනනය (3) ශ්වසනය (4) වර්ධනය

02 ශිෂ්‍යයෙකු පොකුණකින් ගත් ජලයේ ක්ෂුද්‍ර ජීවීන් සිටිදැයි නිරීක්ෂණය කිරීමට සැරසුනි. ඒ සඳහා ඔහු භාවිතා කළ යුතු උපකරණය වන්නේ,
(1) දෙනෙතිය (2) අන්වීක්ෂය (3) අත් කාචය (4) දුරේක්ෂය

03 ස්කන්ධයක් සහිත අවකාශයේ ඉඩක් අත්කර ගන්නා දෙයක් නොවන්නේ,
(1) ජලය (2) වාතය (3) පොත (4) ආලෝකය

04 භංගුරතාව වෙන්වන ද්‍රව්‍යයක් සඳහා උදාහරණයකි
(1) වීදුරු (2) කඩදාසි (3) යකඩ (4) රබර්

05 ඝන අවස්ථාවේ පවතින ජලය සඳහා උදාහරණයක් නොවන්නේ,
(1) හිම (2) අයිස් (3) ග්ලැසියර් (4) හුමාලය

06 කාබන්ඩයොක්සයිඩ් වායුව මගින් කිරිපාටට හරවනු ලබන්නේ,
(1) ජලය (2) කොපර් සල්ෆේට් (3) හුණු දියර (4) විනාකිරි

07 ශක්තිය නිපදවීම සඳහා ඉන්ධනයක් ලෙස භාවිතා නොවන ද්‍රව්‍ය වන්නේ,
(1) ජෛව ස්කන්ධ (2) එතනෝල්
(3) කාබන්ඩයොක්සයිඩ් (4) පොසිල ඉන්ධන

08 දීප්ත වස්තුවක් සඳහා උදාහරණයක් නොවන්නේ,
(1) කණාමැදිරියා (2) සඳ (3) සූර්යයා (4) දැල්වෙන ඉටි පන්දම

09 පහත දැක්වෙන ද්‍රව්‍ය අතරින් පාරභාසක ද්‍රව්‍යය තෝරන්න.
(1) මල් වීදුරු (2) කාඩ්බෝඩ් (3) කළු කඩදාසි (4) පිරිසිදු වතුර

10 

දී ඇති චුම්බකය හැඩය අනුව කුමන වර්ගයට අයත් වේ ද?
(1) දණ්ඩ චුම්බකය (2) බුරප චුම්බකය
(3) වලයාකාර චුම්බකය (4) යූ හැඩැති චුම්බකය

11 ඩයෝඩයක සම්මත සංකේතය වනුයේ,

(1) 

(2) 
(3) 
(4) 

12 මිනිසාගේ සාමාන්‍ය ශරීර උෂ්ණත්වය කොපමණ ද?
(1) 38 °C ය. (2) 34 °C ය. (3) 37 °C ය. (4) 35 °C ය.

13
මෙම රූපයේ දැක්වෙන ජීවියා ගන්නා ආහාර අනුව කුමන කාණ්ඩයට අයත් වේ ද?
(1) ශාක භක්ෂක (2) මාංශ භක්ෂක
(3) සර්ව භක්ෂක (4) ඉහත කිසිවක් නොවේ.

14 දැඩි නියං සමයක පරිසරයේ දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,
(1) ලැව්ගිනි හටගැනීම. (2) පොළව ඉරිතලා යාම.
(3) අහස වළාකුළින් බරවීම. (4) ගස්වල කොළ හැලීයාම.

15 පහත දැක්වෙන්නේ එක්තරා ආහාර දාමයකි.

A → මුවා → සිංහයා   මෙහි A පිළිබඳ අසත්‍ය වගන්තිය වන්නේ,

(1) නිෂ්පාදකයා ලෙස හඳුන්වයි.
(2) සූර්ය ශක්තිය ආධාරයෙන් ආහාර නිපදවයි.
(3) අනෙකුත් සියලු ජීවීන්ගේ පැවැත්ම මොවුන් මත රඳාපවතී.
(4) ඉහත කිසිවක් සත්‍ය නොවේ.

16 තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් නොවන්නේ,

(1) රත්නපුරය   (2) ගම්පහ   (3) හැටන්   (4) අම්පාර

17 සුළඟේ වේගය මැනීමට භාවිතා කරන උපකරණය වන්නේ,

(1) සුළං දිශා දර්ශකය   (2) වර්ෂාමානය   (3) ආර්ද්‍රතාමානය   (4) අනිලමානය

18 පෘථිවි පෘෂ්ඨයේ අඩංගු ජල ප්‍රතිශතය වන්නේ,

(1) 60%   (2) 70%   (3) 1%   (4) 10%

19 පත්‍රිකාවලට බෙදුනු ශාක පත්‍රයකට උදාහරණයක් වන්නේ,

(1) කොස්   (2) කරපිංචා   (3) අඹ   (4) බෝ

20 ශාක තම ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතා නොකරන්නේ,

(1) ඔක්සිජන්   (2) කාබන්ඩයොක්සයිඩ්
(3) ජලය   (4) සූර්ය ශක්තිය

(2 x 20 = 40)

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 A පහත දී ඇති සටහන අධ්‍යයනය කරන්න.

(i) ඉහත සටහන හැඳින්වීමට භාවිතා කරන නම කුමක් ද?
(ii) ඉහත සටහන පදනම්කොට ආහාර දාම තුනක් ලියා දක්වන්න.
(iii) මෙම සටහනේ නිෂ්පාදකයා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?
(iv) ඉහත සටහනේ හමුවන මාංශ භක්ෂකයින් දෙදෙනෙකු නම් කරන්න.

B පහත දැක්වෙන දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.



02 A පහත සඳහන් දෑ ඒවායේ ගතිගුණ සමග සසඳන්න.

A		B	
(i)	ප්‍රත්‍යාස්ථ ලක්ෂණ පෙන්වයි.	(a)	කාඩ්බෝඩ්
(ii)	තන්‍යතා ලක්ෂණ පෙන්වයි.	(b)	පිරිසිදු වතුර
(iii)	පාරදෘශ්‍ය වස්තුවකි.	(c)	අඟුරු
(iv)	භංගුරතාව පෙන්වයි.	(d)	රබර්
(v)	පාරාන්ධ වස්තුවකි.	(e)	රත්තරන්
(vi)	වයනය මෘදුය.	(f)	පුයර

B පහත දී ඇති වචන භාවිතයෙන් සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.
(ස්කන්ධයක් / ශක්ති / වායු / අවකාශයේ / හැඩයක්)

(i) .... සහිත වීම හා .... ඉඩක් අත්කර ගැනීම පදාර්ථයේ ලක්ෂණයක් වේ.

(ii) ඝන පදාර්ථවලට නිශ්චිත .... හා පරිමාවක් ඇත.

(iii) නිශ්චිත පරිමාවකුත්, හැඩයකුත් .... පදාර්ථවලට නොමැත.

(iv) ආලෝකය යනු .... වර්ගයක් වේ.

03 A විවිධ ශක්තීන් භාවිතා කර අපගේ එදිනෙදා වැඩ සිදුකරගන්නා අතර, එලෙස ශක්තිය සපයන දෑ ශක්ති ප්‍රභව ලෙස අප හඳුන්වමු.

(i) පොසිල ඉන්ධන යනු මොනවා ද?

(ii) පොසිල ඉන්ධන වර්ග දෙකක් නම් කරන්න.

(iii) පොසිල ඉන්ධන බහුලව හමුවන රටවල් දෙකක් නම් කරන්න.

(iv) ඔබේ නිවසේ ශක්තිය අපතේ යන අවස්ථා 2 ක් නම් කරන්න.

(v) ඔබේ නිවසේ ශක්ති පරිභෝජනය අඩුකර ගැනීමට කළහැකි දේවල් දෙකක් සඳහන් කරන්න.

B එක් එක් අවස්ථාව සඳහා භාවිතා කරන ශක්ති ප්‍රභවය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

ශක්තිය පරිභෝජනය වන අවස්ථාව	භාවිතා කරන ශක්ති ප්‍රභවය
1. ධාන්‍ය වියලීමට	(a) ....
2. ආහාර පිසීමට	(b) ....
3. වාහනයක් ධාවනය කිරීමට	(c) ....

04 A ශබ්දය නොහොත් ධ්වනිය ඇතිකරන වස්තු ධ්වනි ප්‍රභව ලෙස හඳුන්වයි.

(i) ස්වභාවික ධ්වනි ප්‍රභවයක් නම් කරන්න.

(ii) කෘත්‍රිම ධ්වනි ප්‍රභවයක් නම් කරන්න.

(iii) ශබ්දය හඳුනාගැනීමට උපකාරී වන ඉන්ද්‍රි ය කුමක් ද?

(iv) අධික ශබ්දවලින් එම ඉන්ද්‍රියට සිදුවන හානිය වළක්වා ගත හැක්කේ කෙසේද?

B චුම්බක එදිනෙදා විවිධ අවස්ථාවල ප්‍රයෝජනයට ගනී. පහත අවස්ථාවල දී දක්නට ලැබෙන නිරීක්ෂණ ආකර්ශන ද, විකර්ෂණදැයි ලියා දක්වන්න.

(i) | S | N | | N | S |

....

(ii) | N | S | | N | S |

....

(iii) | N | S | | S | N |

....

(iv) එදිනෙදා ජීවිතයේ දී චුම්බක භාවිතා කරන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(v) පහත ද්‍රව්‍ය අතරින් චුම්බකයකට ආකර්ශනය වන ද්‍රව්‍ය හා නොවන ද්‍රව්‍ය වෙන් වෙන්ව සඳහන් කරන්න.

(වීදුරු කූරක් / යකඩ ඇණයක් / ඇමුණුම් කටු / පෑනක්)

05 A රටක කාලගුණය හා දේශගුණය පිළිබඳ තොරතුරු දැනගෙන සිටීම අපට ඉතා වැදගත් ය.

(i) කාලගුණය පිළිබඳ ව තොරතුරු රැස්කරන ප්‍රධාන රජයේ ආයතනය කුමක් ද?

(ii) කාලගුණය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමේ දී බහුලව භාවිතා වන සාධක දෙකක් සඳහන් කරන්න.

(iii) කාලගුණ තොරතුරු ලබාගැනීමට භාවිතා කරන උපකරණ දෙකක් නම් කරන්න.

B (i) වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනයේ ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාව කලාප හතරකට බෙදා ඇත. එම කලාප නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාවට බලපාන ප්‍රධාන ස්වභාවික විපත් දෙකක් නම් කරන්න.

(iii) ඉහත සඳහන් එක් විපතකින් සිදුවන හානිය අවම කර ගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න.

06 A (i) ප්‍රසාරණය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

(ii) රූප සටහනේ A, B හා C කොටස් නම් කරන්න.

(iii) මෙම පරීක්ෂණය සැලසුම් කරනුයේ කුමක් අධ්‍යයනය කිරීම පිණිස ද?

(iv) ඉහත පරීක්ෂණයේ ඔබට දක්නට ලැබෙන නිරීක්ෂණයක් සඳහන් කරන්න.



B පහත වගන්ති හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

(i) සමහර ශල්‍යකර්මවල දී ලේසර් කිරණ භාවිතා වේ. (   )

(ii) ආලෝකය සරල රේඛීයව ගමන් නොකරයි. (   )

(iii) දීප්ත වස්තු තමා විසින්ම ආලෝකය නිපදවා නොගනී. (   )

(iv) රතු පැහැති ආලෝකය බොහෝවිට අනතුරක් හඟවයි. (   )

(v) ආලෝක කිරණ රාශියක එකතුව ආලෝක කදම්භයකි. (   )

07 A ජලය යනු සියලුම ජීවීන්ගේ පැවැත්ම සඳහා වැදගත් වන අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයකි.

(i) භෞතික අවස්ථාවන් අනුව ජලය පවතින ප්‍රධාන ආකාර නම්කොට ඒ එක් එක් අවස්ථාව සඳහා එක් උදාහරණය බැගින් දෙන්න.

(ii) ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා හතරක් සඳහන් කරන්න.

(iii) ජල දූෂණයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

(iv) නිවස තුළ දී ජලය අපතේ යන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

B (i) රසායනික කෝෂ වර්ග කළ හැකි ප්‍රධාන ආකාර දෙක කුමක් ද? ඒ එක් එක් වර්ගය සඳහා උදාහරණය බැගින් ලබාදෙන්න.

(ii) පහත සංකේතවලින් හඳුන්වන උපාංගය කුමක්දැයි දක්වන්න.

(a)

(b)

(c)

(d)

(iii) ඩයෝඩ යනු සරල ඉලෙක්ට්‍රොනික උපාංගයකි. මෙහි ප්‍රධාන කාර්යය කුමක් ද?